දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650 / 011-2136700

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011- 2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } info @psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. } PSC/APL/14/67/2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024.02. 27

---

**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය</u>**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව වහාම එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යථෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

04) එමෙන්ම, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ස්ථානමාරු නියෝගයන්ට එරෙහි අභියාචනා ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ස්ථානමාරු පටිපාටියෙහි **අභියාචනා ක්‍රියා පටිපාටිය (වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ නියෝගවලට එරෙහිව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත අභියාචනා කළ යුතු බව සහ එලෙස වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටුව වෙත අභියාචනා කිරීමකින් තොරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ නොහැකි බව)** කෙරෙහි අවධානය යොමු කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස ඔබට දැන්වීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් දන්වා සිටිමි.

05) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

06) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

07) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

08) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

09) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Ndayal

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2024
## රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය මඟින් කර ඇති ඉල්ලීම | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|---|
| 1 | ජේ. මිත්‍රාජ් මයා | කථිකාචාර්ය III | දර්ගානගර් ජා.අ.වි. | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.කැකිරාව ගු.වෘ. ස. ම.<br>2.වව්නියාව ජා.අ.වි. වෙත ස්ථාන මාරු කිරීම | ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නව පත්වීම් ලබා දීමේදී දර්ගානගර් ජා.අ.වි. වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දීමෙන් අනතුරුව වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය වෙත ස්ථාන මාරුව ලබා දීම. |
| 2 | එස්.එම් හෙට්ටිආරච්චි මිය | කථිකාචාර්ය III | මහනුවර ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය (ගු.වෘ. ස. ම.) | අදාල නොවේ | ගම්පහ ගු.වෘ. ස.ම වෙත ස්ථාන මාරු කිරීම | ගම්පහ ගු.වෘ. ස.ම වෙත ස්ථාන මාරුව ලබා දීම. |
| 3 | පී.එම්.සී. ආර්. පතිරාජ මිය | කථිකාචාර්ය III | පම්බල ගු.වෘ. ස. ම. | ස්ථාන මාරු ලබා දී නොමැත | මාරවිල ගු.වෘ.ස.ම වෙත ස්ථාන මාරු කිරීම | මාරවිල ගු.වෘ.ස.ම වෙත ස්ථාන මාරුව ලබා දීම. |
| 4 | කේ. ටී. එස්. සිරිවර්ධන මිය | කථිකාචාර්ය I | පුලතිසිපුර ජා.අ.වි | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.රුහුණ ජා.අ.වි<br>2.උණවටුන ගු. වි.<br>3.නිල්වලා ජා.අ.වි<br>4.ගාල්ල ගු.වෘ. ස. ම. වෙත ස්ථාන මාරු කිරීම | ස්ථාන මාරු ඉල්ලා ඇති සේවා ස්ථානයන්හි පුරප්පාඩු නොමැති වීම හේතුවෙන් අභියාචනය නිෂ්ප්‍රභ කිරීම. |
| 5 | එස්. ජෙයබාන්දන් මයා | කථිකාචාර්ය III | ශ්‍රී පාද ජා.අ.වි | අදාල නොවේ | හාලි ඇල ගු.වෘ. ස. ම. වෙත ස්ථාන මාරු කිරීම | ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නව පත්වීම් ලබා දීමේදී ශ්‍රී පාද ජා.අ.වි. වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දීමෙන් අනතුරුව හාලි ඇල ගු.වෘ. ස. ම. වෙත ස්ථාන මාරු කිරීම |

26/02/2024

26/02

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය මඟින් කර ඇති ඉල්ලීම | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|---|
| 6 | එල්. ශිවකුමාර් මයා | කථිකාචාර්ය III | කොටගල ගු.වෘ. ස. ම. | ස්ථාන මාරු ලබා දී නොමැත | ශ්‍රී පාද ජා.අ.වි. වෙත ස්ථාන මාරු කිරීම | ශ්‍රී පාද ජා.අ.වි. වෙත ස්ථාන මාරු ලබා දීම. |
| 7 | එම්. අභිලාන් මයා | කථිකාචාර්ය III | කොටගල ගු.වෘ. ස. ම. | ස්ථාන මාරු ලබා දී නොමැත | ශ්‍රී පාද ජා.අ.වි. වෙත ස්ථාන මාරු කිරීම | ශ්‍රී පාද ජා.අ.වි. වෙත ස්ථාන මාරුව ලබා දීම |
| 8 | ජී.කලෛඅරසු මයා | කථිකාචාර්ය III | කොටගල ගු.වි | ස්ථාන මාරු ලබා දී නොමැත | 1. හැටන් ගු.වෘ. ස. ම<br>2.ශ්‍රී පාද ජා.අ.වි.<br>3.මහරගම ජා.අ.වි.<br>4.පේරාදෙණිය ජා.අ.වි. වෙත ස්ථාන මාරු කිරීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 9 | ඒ. සෙන්දන් | කථිකාචාර්ය III | වව්නියාව ජා.අ.වි. | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.යාපනය ජා.අ.වි<br>2.කෝපායි ගු.විද්‍යාලය<br>3.වලිකාමම් ගු.වෘ. ස. ම වෙත ස්ථාන මාරු කිරීම | ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නව පත්වීම් ලබා දීමේදී වව්නියාව ජා.අ.වි. වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දීමෙන් අනතුරුව කෝපායි ගුරු විද්‍යාලය වෙත ස්ථාන මාරුව ලබා දීම. |
| 10 | ටී. සරවනන් මයා | කථිකාචාර්ය III | වව්නියා ජා.අ.වි | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.මඩකලපුව ජා.අ.වි<br>2.මඩකලපුව ගු. වි.<br>3.අඩ්ඩාලච්චේන ජා.අ.වි<br>4.අඩ්ඩාලච්චේන ගු. වි.<br>5.පදිරිප්පු ගු.වෘ. ස. ම. වෙත ස්ථාන මාරු කිරීම | ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නව පත්වීම් ලබා දීමේදී වව්නියාව ජා.අ.වි. වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දීමෙන් අනතුරුව මඩකලපුව ගුරු විද්‍යාලය වෙත ස්ථාන මාරුව ලබා දීම. |

26/02/2024

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය මගින් කර ඇති ඉල්ලීම | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|---|
| 11 | පී. ඉලයරාජා මයා | කථිකාචාර්ය III | සාරිපුත්ත ජා.අ.වි (දඹදෙණිය) | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.ගම්පොළ ගුරු වි. 2.පේරාදෙණිය ජා.අ.වි. 3.ගම්පොළ ගු. වෘ. සං. ම. 4.මහවැලි ජා.අ.වි. 5.කොත්මලේ ගු. වෘ. සං. ම. වෙත ස්ථාන මාරු කිරීම | ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නව පත්වීම් ලබා දීමේදී සාරිපුත්ත ජා.අ.වි. වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දීමෙන් අනතුරුව ගම්පොළ ගුරු විද්‍යාලය වෙත ස්ථාන මාරුව ලබා දීම. |
| 1.. | ඩී. ජී.කේ.ප්‍රියංගිකා මිය | කථිකාචාර්ය III | නිල්වලා ජා.අ.වි (මාතර) | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.පස්දුන්රට ජා.අ.වි වෙත ස්ථාන මාරු කිරීම | ස්ථාන මාරු ඉල්ලා ඇති සේවා ස්ථානයන්හි පුරප්පාඩු නොමැති වීම මත අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 13 | වී .ඥානසම්බන්දන් මයා | කථිකාචාර්ය III | වව්නියා ජා.අ.වි | ස්ථාන මාරු ලබා දී නොමැත | 1.යාපනය ජා.අ.වි 2.කෝපායි ගු.විද්‍යාලය වෙත ස්ථාන මාරු කිරීම | ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති සේවා ස්ථානයන්හි පුරප්පාඩු නොමැති වීම මත, අභියාචනය නිශ්ප්‍රභ කිරීම සහ මීළඟ වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී මෙම අභියාචක වෙත ප්‍රමුඛතාවයක් දක්වන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දීම. |

26/02/2024

02/26